# පර්යේෂණයකින්


# බිත්තරයේ කාසියේ වාසිය?

ඉල්ලුම හා සැපයුම පිළිබඳ සරල ආර්ථික න්‍යාය යම් භාණ්ඩයක මිළ තිරණය කිරීමේදී ස්වාධීනව ක්‍රියා කරන්නේය යන්න පිළිගත් මතයකි. එහෙත් බිත්තර සපයන්නන් (වෙළෙඳුන්) සතුව ඇති ඒකාධිකාරි හෙවත් ඒකරාශි වූ බලය මෙයට බලපෑම් ඇතිකළ හැකි අතර, ඔවුන් සතුව ඇති විශාල තොග මගින් මිළ සිරවිය හැකිවී ඇත.

බිත්තර මිල නියම කරනුයේ බිත්තර වෙළෙඳ පොල පාලනය කරන හා හසුරුවන කොළඹ (වැල්ලවත්තේ හා පිටකොටුවේ) තොග වෙළෙඳුන් විසිනි. එදිනෙද බිත්තර මිළ ගණන් නියම කිරීමේදි සම්පූර්ණයෙන් පාහේ කටයුතු කරන්නේ විශේෂයෙන් වැල්ලවත්තේ සිටින එක් තොග වෙළෙන්දෙක් බව සැළකිය හැකිය. දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින කුකුල් ගොවිපල හිමියන් කොළඹ සම්මත මිළ ලෙස මෙම වෙළෙඳුන්ගේ මිළ දර්ශනය සැලකීමටත්, ඒ අනුව ක්‍රියා කිරීමටත් පුරුදුවී සිටිති. (වෙනත් වචන වලින් කිවහොත් මෙම වෙළෙන්දා ප්‍රදර්ශනය කරන මිළ දර්ශනය 'කොළඹ මිලෙහි' සාමාන්‍ය හා පාලනය කරන ඒකකය ලෙස සැලකීමට පුරුදු වි සිටිති.)

අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවද දෛනික මිළ ගණනය කිරිමේදී අතලොස්සක් වන පෞද්ගලික වෙළෙඳුන් නියම කරන මිළ කෙරෙහි විශ්වාසය තබයි. වෙළෙඳ පොලේ විකිණීම වලින් දළ වශයෙන් 60% ක් පිටකොටුවේ වෙළෙඳුන්ටද, 24%ක් වැල්ල වත්තේ වෙළෙඳුන්ටද 1.6% අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවටද හිමිවී ඇත.

සෑම විටම බිත්තර ඉල්ලුම සැපයුමට වඩා ඉහලින් පවතින අතර, අලෙවි සංවර්ධන දෙපාර්ත මේන්තුවේ වර්තමාන බිත්තර එකතු කිරීමේ ප්‍රමාණය



ඒකාධිකාරි පාලනයට මෙයත් අයත්ද?

සාර්ථක තොග රැස් කිරීමක් ලෙස සැලකිය නොහැකි බවත් පෙනී යන්නේය.

ඒ ඒ වාරවල මිල වෙනස්වීම විවිධ හේතූන් නිසා සිදුවේ. සත්ව ආහාර මිළ හැරුණු විට බිත්තර වෙළෙඳ පොලේ මිල කෙරෙහි බලපෑම් කෙරෙන වෙනත් හේතූන්ද ඇති බවට සාක්ෂි ඇත්තේය. මෙහි වෙනත් තැනක සඳහන් කළ පරිදි බිත්තර මිළ ඉතා ඉහල මට්ටමකට නැගුන විට, එයට හේතුවී ඇත්තේ සත්ත්ව ආහාර මිළ ඉහළ යෑම යයි පැමිණිලි කරන්නට තරම්

වැල්ලවත්තේ හා කොළඹ ව්‍යාපාරික ඒකාධිකාරිහු උත්සුකවූහ. එහෙත් සත්ව ආහාර මිළ අඩුවීමට සමානුපාතිකව මිළ අඩු කිරීමක් සිදු නොවිය.

බිත්තර විකිණීමේ ප්‍රධානතම මාර්ගය වී ඇත්තේ රාජ්‍ය අංශයේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවත් තොග හා සිල්ලර වෙළෙඳුන්ගෙන් සමන්විත පෞද්ගලික සංවිධානත්ය. ඔවුන් සතු බෙලහීන කේවල් කිරීමේ බලය නිසාත්, ප්‍රමාණවත් නොවන අලෙවි පහසුකම් නිසාත් කුඩා ගොවිපල හිමියෝ පීඩනයට පත්ව සිටිති. බිත්තර වෙළඳාමට දිනෙන් දින එක්වන අතර මැදියන්ගේ සංඛ්‍යාව වැඩිවීමේ හේතුවෙන් පාරිභෝගිකයාට වැඩි මිළක් ගෙවීමට හේතුවී ඇත. පෞද්ගලික අංශයේ බිත්තර එකතු කිරීමේ ක්‍රියාවලියට සුළු පරිමාණයේ එකතු කරන්නන්, කඩ හිමියන් සහ තොග හා සිල්ලර වෙළෙන්දන් එක්වී සිටිති.

මිළදී ගැනීමේදී හා මිළ ගෙවීමේදී ඇතිවන ප්‍රමාදයන්, හා ප්‍රවාහන පහසුකම් නොතිබීම හා අඩු මිලක් ගෙවීම වැනි හේතු නිසා නිෂ්පාදකයන් සිය බිත්තර අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුවට විකිණීමට මැලිවී සිටිති. මෙයට වෙනත් මගක යන පෞද්ගලික වෙළෙන්දෝ ගොවි පලටම ගොස්, කිසිදු ප්‍රමාදයක් නොමැතිව බිත්තර මිළදී ගත් වහාම මිල ගෙවති.

සම්පූර්ණ අලෙවි වියදමින් විශාල කොටසක් පෞද්ගලික තොග වෙළෙන්දා විසින් ලබා ගැනීම එක් කරුණකි. මේ පිළිබඳව කළ ගණනය කිරීම අනුව බිත්තරයක මිළ සැදී ඇත්තේ මෙසේය.

| | |
|---|---|
| නිෂ්පාදකයාගේ නිෂ්පාදන වියදම | 72.5% |
| නිෂ්පාදකයාගේ ලාභය | 12.5% |
| අලෙවි වියදම | 15% |

අලෙවි වියදම සැදී ඇත්තේ මේ අයුරිනි.

| | |
|---|---|
| ප්‍රවාහන, තැන්පත් කිරීම හා ඇහිරීම වියදම් | 5% |
| තොග හා සිල්ලර වෙළෙඳුන්ගේ වියදම | 10% |

ඉතා විශ්වාස කටයුතු අන්දමට ශමය තොග වෙළෙඳුන්ට 7.5% ක්ද, සිල්ලර වෙළෙඳුන්ට 25% ක්ද වේ.

වෙළෙඳ පොලේ මිල ඉහල යන විට එයින් ඉතා විශාල ප්‍රමාණයක් වෙළෙන්දන් ලබා ගන්නා අතර, එයින් නිෂ්පාදකයාට ලැබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයකි. අනිත්පැත්තෙන් මිළ පහල යන විට මිළ අඩුවීමේ ප්‍රතිඵල වලින් විශාල කොටසක් විඳිමට සිදුවේ.

× × ×

වැඩි වශයෙන් මිලදී ගන්නන් ඇදී ඒමට හා අලෙවි කිරීම පහසු වීමට හේතුවන තොග ගබඩා කිරීමේ හා අලෙවි කිරීමේ පහසුකම් වලින් සමන්විත සෑම වැදගත් නිෂ්පාදන ප්‍රදේශයකට "නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති" පිහිටුවියයුතු යැයි අපි අතිශයින් අවධාරණය කරන්නෙමු. මිළදී ගන්නන් ගැන සැලකීමේදී මිලදී ගැනීමේ මිල හා නිෂ්පාදකයන්ගේ අලෙවි වියදම් අඩු වීමටද මෙය හේතුවනු ඇත. මෙ පිළිබඳව අතිශය වැදගත් ආදර්ශයක් සපයන ක්‍රියාශීලී මාරවිල නිෂ්පාදන සමුපකාර සමිතියට නිෂ්පාදකයන් සතුව තිබූ ප්‍රශ්න රාශියක් විසඳා ගැනීමට හැකිවී ඇත. සත්ත්ව නිෂ්පාදනයන් සතුව දැන් පවතින සංවිධාන නිෂ්පාදන සමුපකාර සමිති බවට පරිවර්තනය කිරීම හා නව සංවිධාන ගොඩ නැංවීම කළයුතු අතර එමගින් ප්‍රබල සංවිධානයක් ගොඩ නැංවීමෙන් නිෂ්පාදකයන්ට ඉතා විශාල කේවල් කිරීමේ බලයක් ලැබෙනු ඇත.

සාමාන්‍යයෙන් වෙළෙන්දා හා සැපයුම් කරුවන් සමහ සසඳන විට කුඩා නිෂ්පාදකයා සතුව ඇත්තේ දුර්වල කේවල් බලයක් නිසා, එමගින් හොඳ මිලක් ලබා ගැනීමට ඔහුට නොහැකිවේ. සිය සාමාජික පශු සම්පත් නිෂ්පාදකයන්ගේ දක්ෂ අලෙවි නියෝජිතයන් ලෙස සමුපකාර සමිති ඉතා සාර්ථක සේවයක් නවසීලන්තය, ඩෙන්මාර්කය හා ස්වීඩනය වැනි රටවල ඉටු කරන බව ප්‍රකට කරුණකි. මේ රටේ පවා එළවලු නිපදවන සමහර ප්‍රදේශවල නිෂ්පාදන සමුපකාර සාර්ථකව ක්‍රියාත්මක වේ.

උදාහරණයක්: කැප්පෙටිපොල. තවත් සාර්ථක උදාහරණයක් ඉදිරිපත් කරන වේයන්ගොඩ හා පූගොඩ බුලත් නිෂ්පාදකයන්ගේ මාක්පෙඩ් සමුපකාර සමිති වලට අතර මැදියන් ඉවත් කර නිෂ්පාදකයන්ගේ ආදායම 110%කින් වැඩි කිරීමට හැකිවී ඇත්තේය."

(ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අංක 41 දරණ පර්යේෂණ අධ්‍යයනය වන, "ශ්‍රී ලංකාවේ කුකුලන් ඇතිකිරීමේ කර්මාන්තය" පර්යේෂණ ග්‍රන්ථයෙන් උපුටා ගන්නා ලද්දකි. පර්යේෂකයන් අතුල චන්ද්‍රසිරි හා අශෝකා ශේපාල- මෙම ප්‍රකාශනය ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් මිළදී ගත හැකිය. මිළ රු. 35/කි)